1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/07/01/03 | ඔබේ අංකය<br>உமது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.09. 02 |
|---|---|---|---|---|---|

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 02/2025 (I)**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

**<u>ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පරිවර්තිත දීමනා</u>**

දකුණු පළාත් සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පරිවර්තිත දීමනා සංශෝධනය කරමින් නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02/2025 හා බැඳේ.

02. එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු, එහි සඳහන් ඇතැම් සේවාවන්ට සිදු ව ඇති බව සඳහන් විෂමතා සහ අතැම් සේවාවන්හි රාජකාරී ස්වභාවයන් පිළිබඳව සලකා බලා එම චක්‍රලේඛයේ මතු සඳහන් තනතුරු මෙන්ම එකී තනතුරුවලට අදාළ පරිවර්තිත දීමනා ද පහත පරිදි සංශෝධනය කිරීමට පරිවර්තිත දීමනා සංශෝධනය පිණිස පත් කර ඇති කමිටුව විසින් යෝජනා කර ඇති බැවින්, ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02/2025 හි සඳහන් පහත තනතුරු සම්බන්ධයෙන් මතු දැක්වෙන සංශෝධන සිදු කරන බැව් මෙයින් කාරුණිකව දන්වමි.

| අමාත්‍යාංශය | දෙපාර්තමේන්තුව | තනතුර | ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 02/2025 අනුව පරිවර්තිත දීමනාව (රු.) | යෝජිත පරිවර්තිත දීමනාව (රු.) |
|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | සෞඛ්‍ය සේවා | පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී | 5,000.00 | 7,500.00 |
| | | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරී | 6,800.00 | 9,000.00 |
| | | පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) * | 8,600.00 | ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 02/2025 හි ස්ථාන දෙකක සඳහන්ව ඇති මෙම තනතුරු, පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය)* /මහජන සෞඛ්‍ය පරීක්ෂක (විශේෂ ශ්‍රේණිය) ලෙසින් එක් තීරයක ඇති සේ සලකා කටයුතු කළ යුතු ය. |
| | | මහජන සෞඛ්‍ය පරීක්ෂක | 8,600.00 | |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

| | | | | |
|---|---|---|---|---|
| ක්‍රීඩා අමාත්‍යාංශය | ක්‍රීඩා | ක්‍රීඩා නිලධාරී | 5,200.00 | 6,200.00 |
| | | ක්‍රීඩා පුහුණුකරු | 7,200.00 | 7,800.00 |
| | | දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී | 8,900.00 | 10,300.00 |
| | | ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරී | 8,900.00 | 10,300.00 |

03. ඒ අනුව, ඉහත නම් සඳහන් ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පරිවර්තිත දීමනා, ඉහත දක්වා ඇති සීමාවන්ට යටත්ව වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමා තුළ කළමනාකරණය කරගනිමින් 2025.01.01 දින සිට ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2025.08.29 දිනැතිව ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ G/SP/1/2/Allowance/01 අංක දරන 2025.08.31 දිනැති ලිපිය මඟින් දන්වා ඇත.

04. දකුණු පළාත් සභාවේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ පරිවර්තිත දීමනා සංශෝධනය කරමින් නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 02/2025 හි සඳහන් සෙසු කරුණු නොවෙනස්ව පවතින බව වැඩිදුරටත් දන්වමි.

**සුමිත් අලහකෝන්**
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍ය. විග. දෙපාර්තමේන්තුව, දකුණු පළාත. - දැ.ගැ.පි.

දුරකථන : **091-49 44 007** ෆැක්ස් : **091-22 32 691** විද්‍යුත් තැපැල : **depoffinance7@gmail.com**